


**ශ්‍රී. බු. ව. 2560 ක්වූ නිකිණි මස කලාපය, රා. ව. 2016 ක් වූ අගෝස්තු මස 17 වන දින**

**වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**

**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# සද්ධර්මය සහ සත්පුරුෂයා, අසද්ධර්මය සහ අසත්පුරුෂයා

**(මජ්ඣිමනිකාය චූළපුණ්ණම සූත්‍රය ඇසුරිනි)**

**ධර්මකාමී සත්පුරුෂ පින්වතුනි,**

**අද නිකිණි පුර පොහෝ දිනයයි. භික්ෂූන් වහන්සේලා පසුවස් එළඹෙන දිනයයි. ශාසන ඉතිහාසයෙහි ප්‍රථම ධර්ම සංගායනාව පැවැත් වූ පොහොයයි.**

**අද මෙම දහම් පණිවුඩයට මාතෘකා කර ගත්තේ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේ අමතා දේශනා කරපු ධර්ම දේශනාවකි. සූත්‍ර පිටකයෙහි මැදුම් සඟියෙහි පණ්ණාසක තුනෙන් 3වෙනි පණ්ණාසකය වන උපරිපණ්ණාසකයට අයත් චූළ පුණ්ණම සූත්‍රයයි. පුරසඳ පැවති දිනයක දේශනා කළ නිසා සූත්‍රයට ඒ නම යොදා තිබෙනවා.**

**බුදු හාමුදුරුවෝ භික්ෂූන් වහන්සේලා පිරිවරා පුර හඳ පැවති රාත්‍රියක සැවැත්නුවර විශාකා මහ උපාසිකාව කරවපු පූර්වාරාමයෙ එළිමහනෙ නිහඬව වැඩ ඉන්නව. නිහඬතාවය බිඳිමින් බුදුහිමියන් අහනවා " මහණෙනි, අසත්පුරුෂය තවත් අසත්පුරුෂයෙක් දැක ඔහු අසත්පුරුෂයෙකු යැයි හඳුනනවාද" නැත ස්වාමීනි ! එසේම "අසත්පුරුෂයා විසින් සත්පුරුෂයෙකු දැක මොහු සත්පුරුෂයෙකු**

යැයි හඳුනා ගනීද?" නැත ස්වාමීනී ! මහණෙනි ඔබ හරි. ඔහු යහපත් ධර්ම දන්නෙ නැහැ. ඒ නිසා සත්පුරුෂයා සහ අසත්පුරුෂයා යන දෙදෙනාම හඳුනන්නේ නැහැ.

ඊට හේතුව අසත් පුරුෂයා ඕ අසත්ධර්මයෙන් යුක්තයි ඕඅසත් පුරුෂ ආශ්‍රයෙන් යුක්තයි ඕඅසත් පුරුෂ සිතිවිලි වලින් යුක්තයි ඕඅසත්පුරුෂ සාකච්ඡාතමයි ඔහු ලඟ තියෙන්නෙ ඕඅසත් පුරුෂ වචන ඔහුකථා කරන්නෙ ඕඅසත්පුරුෂ ක්‍රියා ඔහු ලඟ තියෙන්නෙ  අසත්පුරුෂ වැරදිමත ඔහු දරන්නෙ ඕඅසත්පුරුෂ දන්දීම් ඔහු ලඟ තිබෙන්නෙ. එතැන් සිට ඒ අසත්පුරුෂ ලක්‍ෂණ අට භික්‍ෂූන් වහන්සේට විස්තර කරනව. එසේ විස්තර කර අවසන් වී නැවත අහනව මහණෙනි, "යම් සත් පුරුෂයෙකු තවත් සත්පුරුෂයෙකු දැක ඒ සත්පුරුෂයා සත්පුරුෂයෙකු යැයි හඳුනාගනීද? එසේය සවාමීනි! භාග්‍යවතුන් වහන්සේ වදරනව" එය සිදු වන්නකි. සත්පුරුෂයා සත්පුරුෂ සද්ධර්ම හඳුනනව. එසේම මහණෙනි, සත්පුරුෂයා විසින් අසත්පුරුෂයා අසත් පුරුෂයෙකු යයි දැනගනීද? එසේය සවාමීනි! "මහණෙනි, ඔහු අසත්පුරුෂයෙකුයි හඳුනාගනී". එතැන්පටන් සත්පුරුෂ ගතිවල ලක්‍ෂණ ඉහත ආකාර අටෙන්ම පැහැදිලි කරනව. මෙහි වෙනම ඒ විස්තර නොදැක්වූවද පහත විස්තරවන අසත් පුරුෂයාගේ ගතිවල යහපත් පැත්ත බව දතයුතුයි.

බුදුහාමුදුරුවො ඒ අසත්පුරුෂ ලක්‍ෂණ අට මෙහෙම පැහැදිළි කරනව. එය තේරුම් ගැනීම සත්පුරුෂයෙකු වීමට වැදගත් වෙනව. අසත්පුරුෂය අසත් (පාප) ධර්මයෙන් යුක්තයි. (අසපපුරිසො අසදධමමසමනතාගතොහොති) එසේ වීමට හේතුව ඔහු ත්‍රිවිධරත්නය ගැන ශ්‍රද්ධාව හෙවත් විශ්වාසයක් නැත. පවු කිරීමට ලජ්ජා සහ භය නැහැ. ධර්මය පිළිබඳව බොහෝ දැනුමක් බහුශ්‍රැතකමක් නැහැ. එය ලබාගන්න ඕනකමක් නැහැ. කුසීතයි. හරි සිහි නුවනක් නැහැ. ධර්මය පිළිබඳව මෙනෙහි කිරීමක් නැහැ. ප්‍රඥාවන්ත නැහැ. මෝඩකම් වලින් මුළු ජීවිතයම පිරිල. මෙන්න මේ කරුණු නිසා අසත්පුරුෂයා අසත් ධර්මයෙන් යුක්තයි. එසේ නොවී ත්‍රිවිධරත්නය ගැන හරි අවබෝධයක් ඇතිව, විශ්වාසයෙන් යුතුව උපන්න නිසා නොව ලෝක අපවාදයෙන් ගැලවෙන්න නොව ඉහත කී අගුණධර්මවල යහපත් පැත්ත හෙවත් ශ්‍රද්ධාදී ගුණධර්ම ඇතිකරගෙන මම සත්පුරුෂයෙක් වෙමි යන හැඟීමෙන් සද්ධර්මයෙන් යුක්තව සත්පුරුෂයෙක් විය යුතුයි.

අසත්පුරුෂයා අසත්පුරුෂ ආශ්‍රයෙන් යුක්තයි (අසපපුරිසො අසපපුරිසභතතී හොති) ඔහු තෙරුවන් පිළිබඳ ශ්‍රද්ධාව නැති පාපයෙහි ලජ්ජා භය දෙක නැති ඉතාපහත් අඩු ඇසූපිරූ ගතියෙන් යුතු වීර්‍ය්‍ය නැති කුසීතවූ සිහිමුලාවූ, ප්‍රඥවෙන් තොරවූ කෙනෙකුවේද ඒ අසත්පුරුෂයා ඔහු සමග මිත්‍රවෙති. ඔහුගේ සහායකයෝ වෙති. මේ විදියට අසත්පුරුෂයා අසත්පුරුෂ සේවනය කරයි. තේරුම් ගැනීමේ හැකියාව නැතිනම් ත්‍රිවිධ රත්නය පිළිබඳව ඔහුට ශ්‍රද්ධාව කෙසේ පිහිටයිද එවැනි කෙනෙකු ඇසුරු කරන්නාද අසත් පුරුෂයෙකි. කෙනෙක් නිතරම ඇසුරු කළ යුත්තේ තමන්ගේ ධර්ම ප්‍රඥව දියුණු කරන කෙනෙකි. ඇසුරට ඒ විදියෙ කෙනෙකු නැතිනම් හුදකලා වාසය යහපති. අසත් පුරුෂ ආශ්‍රය නිසා අද අපේ රටේ කොයිතරම් නොදැනුවත්වම ත්‍රිවිධරත්නය පිළිබඳ ශ්‍රද්ධාව නැතිව වෙනත් විශ්වාසයන්ට මුලාවී හිරවී ඇතිබව මේ කාලයේ විශේෂයෙන් දැකිය හැකිය. එබැවින් ඉහතකී අසත්පුරුෂ ආශ්‍රයෙන් ඈත්වී ශ්‍රද්ධාදී ගුණ උපදවා ත්‍රිවිධ රත්නය කෙරෙහිම සිත පවත්වා සත්පුරුෂයෝ ඇසුරු කොට සත්පුරුෂ වෙමු.

තුන්වෙනි ලක්ෂණය වන්නේ අසත්පුරුෂයා අසත්පුරුෂ නරක සිතිවිලිවලින් යුක්තයි. (අසපපුරිසො අසපපුරිස චිනතීහොති) අසත්පුරුෂයා තමන්ට දුක්උපදවන අනුන්ට දුක් උපදවන, තමන්ටත් අනුන්ටත් දෙපාර්ශ්වයටම දුක් උපදවන සිතිවිලි වලින් යුක්තයි. සත්පුරුෂයා තමන්ට සේම අනුන්ටත් දෙපාර්ශ්වයටම යහපතට රෑ දවල් දෙකෙහිම කටයුතු කරනව. ලෝකය වේගයෙන් අසද්ධර්මයට යොමුවීම නිසා අසත්පුරුෂ සිතිවිලි හැම තැනම ක්‍රියාත්මක වෙනව. සොබාදහම පවා ඒ අනුව ක්‍රියාත්මක වෙනව. ආත්මාර්ථය වේගයෙන් රජ කරනව. ඔවුන් දන්නෙ නැහැ තම සිතිවිළි අසත්පුරුෂ බව. ඒ නිසාම එයින් වන හානිය දන්නෙ නැහැ. අනුන්ටද දුක් උපදවනව. ඒ බවද ඔහු දන්නේ නැත්තෙ මුලු චින්තනයම වැරදි නිසාය. ඒ නිසා ධර්මයට විනයට අනුව සිතා අසීමිත ආසාවන් සීමාකොට සද්ධර්මය සමග තමන්ගේ සිත ගලපා සත්පුරුෂ සිතිවිලි පහළ කරමු.

හතරවෙනි ලක්ෂණය අසත් පුරුෂ මන්ත්‍රණ හෙවත් අසත්පුරුෂයා අසත්පුරුෂ සාකච්ඡා කිරීමයි.(අසපපුරිසො අසපපුරිසමනතී හොති) අසත්පුරුෂයාගේ සාකච්ඡාව තමන්ටත් පීඩා පිණිස පවතිනව. අනුන්ටද පීඩාවට හේතු වෙනව. දෙපාර්ශ්වයටම පීඩා පිණිස පවතිනව. සත්පුරුෂයා හැමවිටම තමන්ටත් අනුන්ටත් දෙපත්තටම හිත සුව මන්ත්‍රණ කරනව. එයින්ම හැමට සැපයකි හැමට ඔහු ප්‍රියවේ. ඔහු ඇසුරු කරන්නන්ද අසත්පුරිස ලක්ෂණයෙන් බැහැරවී සත්පුරුෂ වෙනව. එබැවින් සාකච්ඡා කිරිම, කියමන් කීම නුවණින් කළ යුතුය.

පස්වෙනි කාරණය වන්නේ අසත්පුරුෂයා අසත්පුරුෂ වචන කථා කිරීමයි. (අසපපුරිසො අසපපුරිසවාචො හොති) මොනවද අසත්පුරුෂ වචන බොරුකීම, කේලාම් කීම, සැර පරුෂ වචන කීම, දෙලොවට වැඩක් නැති හිස්වචන කථාකිරීමයි. මේවායින් යුක්ත නම් ඒ අසත්පුරුෂයෙකු වීමේ. වාචික සුදුසුකම්ය. ඊලඟට සත්පුරුෂ ලක්ෂණය සඳහා වාචික සුදුසුකම් මොනවාද? බොරු නොකීම, කේලාම් නොකීම, සැරපරුෂ වචන නොකීම, දෙලොවට වැඩ දයක වචන කීමයි. භාග්‍යවතුන් වහන්සේ තම ශ්‍රාවකයින්ට අවවාද කරනවා මෙහෙම "සනනිපතිතානං වො භිකඛවෙ දවයං කරණීයං ධමමීවා කථා අරියොවා තුණාහීභාවො" යම් තැනක රැස්වෙනවා නම් ඔය ඇත්තන්ට කරන්න තිබෙන්නෙ කාරණා දෙකයි. ඔබ විසින් කථාකරනවනම් දැහැමි කථාවක් කරන්න. එහෙම නැතිනම් ආර්‍ය්‍ය තුෂ්ණිම්භාවය හෙවත් මෛත්‍රී සහගත නිහඬ වීමයි. සමහරු කරන වරද සාධාරණීකරණය කිරීමට කියනව අනුන්ට කරදරයක් නොවන බොරුවක් නම් කියනව කියල එහෙම බොරු වර්‍ගයක් ලෝකයේ නැත. බොරුවනම් බොරුවමයි. සත්පුරුෂකම නම් සත්පුරුෂ කමයි. ඒ නිසා සූත්‍රයේ මුලදීම සඳහන් වෙනව සත්පුරුෂ ලක්ෂණ ඇතිකරගන්නා ශ්‍රද්ධාව, ප්‍රඥාව, සිහිය, වීර්‍ය්‍ය, බහුශ්‍රැතකම, ලජ්ජා භය, තිබිය යුතුයි කියල. ඒ අනුව සත්පුරුෂයෙකු වෙමු.

හයවෙනි කාරණය වන්නේ අසත්පුරුෂයා අසත්පුරුෂ ක්‍රියා හෙවත් අසත්පුරුෂ වැඩ කිරීමයි. (අසපපුරිසො අසපපුරිස කමමනෙතාහොති) අසත්පුරුෂ ක්‍රියා කයින් කරන පාප ක්‍රියාවන් ය. ප්‍රාණඝාතය හෙවත් සතුන් මැරීම, හොරකම් කිරීම, කම්සැප වැරදි ලෙස විඳීම, මේ පාප ක්‍රියා නිසා කරන්නා අසද්ධර්මයෙන් යුක්ත බැවින් අසත්පුරුෂ වෙයි. එයින් වැලකීම සත්පුරුෂයෙකු වීමේ කායික සුදුසුකම්ය. ක්‍රියාවන්ය. ඒ අනුව සත්පුරුෂයෙකු වීමට අවශ්‍ය ක්‍රියා මොනවා දැයි අසත්පුරුෂ ක්‍රියා මොනවාදැයි තේරුම් ගනිමු.

අසත්පුරුෂයෙක් සතු අංග අටෙන් හත්වෙනි කාරණය වන්නේ අසත් පුරුෂ දෘෂ්ටි ඇති වීමයි .(අසපපුරිසො අසපපුරිස දිටඨිහොති). අසත්පුරිස දෘෂ්ටි ඇති පුද්ගලයාගේ දැක්ම හැමවිටම පවත්වන්නෙ වැරදි විදියටය. දීමෙහි ඵල නැත. පූජා කිරීමෙහි ඵල නැත. පුද පරිත්‍යාග දහම් පඬුරු පිදීමෙහි ඵලය නැත. පිංපවු කිරීමෙහි විපාක නැත. මෙලොව පරලොව කියා ගනන් ගත යුතු නැත. මවුපිය දෙපල සම්බන්ධ ගත යුත්තක් නැත. මියගොස් නැවත ඉපදීමක් නැත. මෙලොව පරලොව ගැන නුවනින්. යහපත කියාදෙන උතුමන් ලොව නැත මෙසේ අසත්පුරිස දෘෂ්ටි ඇති වේ.එමෙන්ම අප ජීවිත තුළින් අප නොදැනුවත්ව විවිධ දෘෂ්ටිවාද කරපින්නාගෙන දුකට පත්වනු ඇත. ඒ හැම දුකකටම හේතුව තම දැක්මේ වැරදි ආකාරය නිසාය. බුදුරජාණන් වහන්සේ පිළිබඳව හරි විශ්වාසයක් නොමැති නිසාය. බුදුගුණ නොදන්නා නිසාය. ඉහත දැක්වූ දීමෙහි ඵලක් නැත ආදී දෘෂ්ටිය වරදවා ගැනීම කරනුයේ නොදන්නා කම නිසාය. ඇතැම් විට බෞද්ධයින්ද බුදුදහම සහ විනය වරද්දාගෙන දෘෂ්ටි ගතවූ අය කොපමණ වෙත්ද? ඒ සඳහා ධර්ම විනය පිළිබඳ අවබෝධය තිබිය යුතුය. එවිට ධර්මඅවබෝධයෙන් සත්පුරුෂයෝ වෙති. අසද්ධර්මයෙන් බැහැරවෙති.

අටවෙනි කාරණය වන්නේ අසත්පුරුෂයා අසත් පුරුෂ දනදෙයි (අසපපුරිසො අසපපුරිසදනාං දෙති). සකස්කර නොදෙයි. තම අතින්ම නොදෙයි. ගෞරව නැතිව දෙයි. ඉවතදන අදහසින් දෙයි. කර්මඵල නොසිතා යහපත් දෘෂ්ටියක් නැතිව දෙයි. ඒ අසත්පුරුෂ දීමයි. දන්දීම සත්පුරුෂ ක්‍රියාවකි. නමුත් දීමේ ක්‍රමය අනුව අසත්පුරුෂ ක්‍රියාවක් වී නිරයගාමී වෙනව. එසේ වන්නේ මුලදී සූත්‍රයේ සඳහන් වන ආකාරයට අසද්ධර්මය නිසා යහපත් පැත්ත හෙවත් සද්ධර්මය නොදන්නා කම නිසාය. බලුකපුටු දනයක් දුන්නත් සකස්කොට දිය යුතුයි සිල්වත් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවන්ට දෙන විට සකස්කර දීම ගැන කවර කථාද එමෙන්ම සිල්වතුන්ට ගෞරව කිරීමෙන් තොරව දන්දීමද පාපයකි. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු පිරිස සිල්වතුන්ය. එයින් පැවිදි සිල්වතුන් උසස් සිල්වතුන්ය. සිල්වතුන්ට දන්දීම ගෞරව කිරීම තුලින් ලබන අනුසස් වන්නේ ආයු වර්ණ සැප බල යන සතර ධර්මයෝය. ඒවා ලැබීමට වෙනත් අයට දන් දීමෙන් නොහැකිය. ලෝකයේ උසස්ම සීලවන්තයා බුදුරජාණන් වහන්සේය. අද ඇතැමුන් උන්වහන්සේට බුද්ධ පූජා සිදුකරන ආකාරයෙන්ම සිල්වතුන්ට ගරුබුහුමන් කිරීම ගැන සිතිය හැකිය. සංඝරත්නය පින්කෙත වන්නේ පුණ්‍ය බීජ වැපිරීමට ස්ථානය වන නිසාය. එමෙන්ම තමන්ගේ අතින්ම දියයුතුයි. ආනිශංස බලවත් වන ආකාරයට කර්මඵල විශ්වාසකොට දන්දීමේ පිළිවෙත නූතන දියුණුව සමග අද අත්හැරී ඇත. මියගිය කෙනාට පිංදෙන්නෙ දනය දෙන්නෙ කර්මඵල සඳහාම නොව මියගිය කෙනා කරදර කරාවි කියන බයට හෝ වෙනත් අයට දීපුව නැවත ලබා ගන්න එහෙම නැතිනම් ලෝක අපවාදයෙන් ගැලවීමටය. මේ ක්‍රමයට අසත්පුරුෂ දනයෙන් බැහැරවී සත්පුරුෂ ආකල්ප දරා දන්දීමෙන් සත්පුරුෂයෙක් වෙමු.

මේ කරුණු අට විස්තර කරන ලද භාග්‍යවතුන්වහන්සේ මෙලෙස අසද්ධර්මයෙන් යුක්ත පුද්ගලයා අසත්පුරුෂ සේවනය ඇතිව අසත්පුරුෂ සිතිවිලි ඇතිව අසත්පුරුෂ සාකච්ඡා ඇතිව අසත්පුරුෂ වචන වලින් යුක්තව අසත්පුරුෂ ක්‍රියා ඇතිව අසත්පුරුෂ දෘෂ්ටියෙන් යුතුව අසත්පුරුෂ දන්දීම නිසා මරණින් මතු අසත්පුරුෂයන්ට අයත් යම් ස්ථානයක් වෙයිද එහි උපදිනබව වදාළහ. අසත්පුරුෂ ගතිය යනු එවැන්නන් උපදින ස්ථානයයි. එනම් "නිරයො වා තිරච්ඡානයොනිවා" නිරයේ හෝ තිරිසන් ආත්මභාවයයි.

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කරනව යමෙක් සද්ධර්මයට අනුව සද්ධර්මයෙන් යුක්තව සත්පුරුෂ ආශ්‍රය ඇති, සත්පුරුෂ සිතිවිළි, සත්පුරුෂ සාකච්ඡා නිතර සිදුකර, සත්පුරුෂ වචන කථාකර,එමෙන්ම සත්පුරුෂ ක්‍රියා ඇතිව සත්පුරුෂ දෘෂ්ටි ඇතිව සත්පුරුෂ දන් දීම නිසා මරණින් මතු උපතක් වේද එහි උපදී යනුවෙන් වදාළහ. සත්පුරුෂයන් උපදිනුයේ කවර උපතකින්ද " දෙවමහතතතාවා මනුසසමහතතතාවාති" කාමාවචර දිව්‍යලෝකයන්හි හෝ මනුෂ්‍ය ලෝකයෙහි මහේශාක්‍ය උපතක් ලබන බව වදාළහ.

මේ කරුනු ටික භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කර අවසන් වූ පසු රැස්ව සිටි භික්ෂූන් වහන්සේ මේ ධර්ම දේශනාවට අතිශයින් සතුටු වුනා. මේ සූත්‍රය ඉතා සරළවයි මෙහි දැක්වුයේ. හොඳ නරක දෙක කියාදෙන කදිම පාඩමකි. සත් පුරුෂයා අසත්පුරුෂයා කියල අපි අනුන්ට කියනව. කොපමණකින් සත්පුරුෂ වෙනවද අසත්පුරුෂ වෙනවද කියල භාග්‍යවතුන් වහන්සේ ඉතා අසිරිමත් තීන්දුවක් දෙනව. දැන් අපි දන්නව මෙහි සීමාව. ලෝකයේ තමන්හැර අනිත් අයගැන හිතන්න ඉදිරිපත්වෙන්නෙ අපේ ළඟ තිබෙන ලක්‍ෂණ භාවිත කිරීමෙනුයි. අපි සත්පුරුෂයෝ නම් අපිට නියම සත්පුරුෂයො හඳුනාගත හැකියි.ඒ වගේම නියම සත්පුරුෂයා අපිට හඳුනාගන්න බැරිවෙන්නෙ සත්පුරුෂකමේ උණුහුමවත් අපේලඟ නැති නිසා බව අකමැත්තෙන් වුවද සදධර්මයේ නාමයෙන් පිළිගත යුතුය. ඒ නිසා ලෝකයාට තීන්දු දීමට පෙර තම තමන් සත්පුරුෂයෝ වෙමු.

බුදුපියාණන් වහන්සෙ මෙහිදී මතක්කරනව සත්පුරුෂ ධර්මයන්ගෙන් යුක්ත අය දිව්‍ය මනුෂ්‍ය ගති බලාපොරොත්තු විය යුතුයි කියල. එපමණක් නොව ඒ සථානවල මහේශාක්‍යව ශ්‍රද්ධා සීලාදී ගුණද ඉන්ද්‍රිය ශක්තිය ඥාණ ශක්තිය භව භෝග සැප ඇතිව කාටවත් යටත් නොවී අතනොපා දිවිපවත්වන ආත්මභාව ලැබිය හැකිබවත් අසත්පුරුෂයෙකු වී මරණින් මතු සකළ දුක් සහිත තිරිසන් අපායෙත් නිරයෙහිත් දුක්විඳින සත්වයන් ලෙසට උපදින බවත් වදරා ඇත. ඒ බව සිත්හි දරා මේ චූළපුණ්ණම සූත්‍ර දේශනාව අප හැමට උපනිශ්‍රව සත්පුරුෂයෙකුවී සසර දුකින් එතෙර වීමට ලැබේවායි අධිෂ්ඨාන කරමු.

